## 33 – විමන් දොරටු

විමන් දොරටු දොරගුළු හැර ඇත අතීතයේ
පහන් සිතින් හැරී බලන් සිතුම් සමීරයේ

සතුට සුව සදා සම්දෙ ඔබ එදා
කළ දහසක් දේ සමරමු – බැති කුසුම් පුදා

ඔබේ දිවි පුදා – ලොවට සෙත සදා
සම්දුනි ඔබෙ ගුණ සමරමු – බැති කුසුම් පුදා

වහල් බැම් මුදා – විමුත් මඟ සදා
සත වෙත පැ මෙත සමරමු – බැති කුසුම් පුදා